# පොළොන්නරු රාජධානියේ ආරම්භය

The beginig of the Polonnaruwa Kingdom

හසිත චාමිකර ගුණසිංහ

**Abstract**

The Polonnaru Kingdom is the second kingdom of Ceylon and the last kingdom of the Rajarata civilization. The Polonnaru Kingdom emerged after the collapse of the Anuradhapura Kingdom, but the region's history is recognized to date back to prehistoric times. According to literary sources, the Anuradhapura rulers also paid attention to Polonnaruwa. There are many examples of the rulers of Anuradhapura working to build temples and irrigations to meet the religious and water needs of the Polonnaru people, which gradually increased with population growth. During the Anuradhapura era, Polonnaruwa was also an administrative centre, as kings lived there from time to time. During the Chola rule, Polonnaruwa became their main administrative centre due to its location being very helpful for them in taking care of the Rohana and Malaya Areas. King Vijayabahu (1055-1110), who freed Ceylon from Chola rule around 1070, had Anuradhapura restored. However, considering the domestic and foreign challenges, Polonnaruwa was still the main administrative centre. The Polonnaru kingdom remained active until the invasion of Kalinga Maga in 1215. Kalinga Maga, who gained power in Polonnaruwa, stayed in Polonnaruwa until he was defeated by King Parakramabahu II (1236-1270) of Dambadeniya, according to chronicles. Accordingly, it should be accepted

that Polonnaruwa was an administrative centre until around 1247.

**Keywords:** Polonnaruwa, Chola Rule, Vijayabahu the Great

**හැඳින්වීම**

උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය පොළොන්නරුවයි. පොළොන්නරු රාජධානිය කේන්ද්‍රව පැවතියේ මෙම ප්‍රදේශය ආශ්‍රිතව ය. පැරණි සාහිත්‍ය මූලාශ්‍රයට අනුව පොළොන්නරුව සඳහා භාවිත වූ නම් රැසකි. මහා විජයබාහු රජතුමාගේ (1055-1110) වේලයික්කාර සෙල්ලිපියේ 'පුලස්තිපුරය' සහ 'පුලනරි' යන නම් සඳහන් වේ (EZ Vol. II, 1994:252-253). 'පුලනරි' යනු පොළොන්නරු යන්නේ ද්‍රවිඩ වචනය වන්නට ඇතැයි මහාචාර්ය එච්.ටී. බස්නායක අනුමාන කරයි (බස්නායක, 2006:239). ඒ අනුව පොළොන්නරුව යන ව්‍යවහාරයට දිගු ඉතිහාසයක් ඇති බව හඳුනාගත හැකිය. මීට අමතරව දඹදෙණි යුගයේ සම්පාදිත කඳවුරු සිරිතේ මෙම ප්‍රදේශය හඳුන්වන්නේ 'කඳයුරුපුරය' යනුවෙනි (කරුණාතිලක, 1993:95).

පොළොන්නරුව රාජධානියක් බවට පත්වන්නේ මහා විජයබාහු රජතුමාගේ ප්‍රධානත්වයෙන් වර්ෂ 1070දී පමණය (බස්නායක, 2006:240). එතැන් පටන් වසර 145ක් පමණ පැවති පොළොන්නරු රාජධානියේ අවසන් පාලකයා වූයේ පරාක්‍රම පාණ්ඩ්‍ය රජතුමා (1212-1215) ය. වර්ෂ 1215 කාලිංග මාඝ නම් දරුණු ආක්‍රමණිකයා අතින් හෙතෙම ජීවිතක්ෂයට පත්වීමත් සමග පොළොන්නරු රාජධානිය නිමා වූ බව පොදුවේ පිළිගැනේ (සිංහල මහාවංසය, 1994:80 පරි. 52-78 ගාථා; ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1 කාණ්ඩය 11 භාගය, 1972:500-501). එහෙත් වර්ෂ 1215 පටන් දෙවන පරාක්‍රමබාහු රජතුමා (1236-1270) අතින් පරාජයට පත්වන තෙක්ම කාලිංග මාඝ පොළොන්නරුවේ රජකම් කළ බව වංසකථාවල සඳහන් වේ (පූජාවලිය, 2009:785, 789-790; සිං.ම.ව, 1994:83 පරි. 01-32 ගාථා). ඒ නිසා වර්ෂ 1247 පමණ වන තෙක් පොළොන්නරුව පාලන මධ්‍යස්ථානයක් වශයෙන් පැවති බව පෙනේ (ලියනගමගේ, 2002:201-202).

කාලිංග මාඝ පරාජයට පත් කිරීමෙන් පසුව දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ පුත් බෝසත් විජයබාහු කුමරුගේ ප්‍රධානත්වයෙන් පොළොන්නරුව නැවත ප්‍රතිසංස්කරණය කෙරිණි (පූජාවලිය, 2009:802-804). පසුකලෙක බෝසත් විජයබාහුගේ පුත් තුන්වන පරාක්‍රමබාහු රජතුමා (1287-1293) ද වසර හයක් පමණ පොළොන්නරුවේ රාජ්‍ය කළ බවට තොරතුරු හමු වේ (සිං.ම.ව, 1994:90 පරි. 47-60 ගාථා).

**ඓතිහාසික යුගයේ පොළොන්නරුව**

වසර දහස් ගණනකට පෙර පොළොන්නරුව ආශ්‍රිත කලාපයේ සීමා ඉතා පුළුල් ප්‍රදේශයක් පුරා විහිදී තිබෙන්නට ඇතැයි පුරාවිද්‍යාඥයන්ගේ විශ්වාසයයි. ඒ අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයන් විසූ සීගිරිය මෙම කලාපයේ එක් කෙළවරක් වශයෙන් හඳුනාගැනේ. සීගිරිය, පිදුරංගල හා පොතාන ආශ්‍රිතව හමු වූ සාධක අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් මෙම කලාපයේ මානව හැසිරීම් වාර්තා වේ (අදිකාරී, 2009:183-192).

ආර්ය ජනාවාසකරණය සිදු වූ කාලසීමාවේ පටන් පොළොන්නරුව ආශ්‍රිතව ජනාවාසකරණය වූ බවට ප්‍රකට මතයකි. ඊට හේතුව නම් විජය කුමරු සමග ලක්දිවට පැමිණි විජිත නම් අමාත්‍යවරයා විසින් පිහිටුවන ලද 'විජිතගාම/විජිතපුරය' මෙම ප්‍රදේශයේ පිහිටි බවට ඇති පිළිගැනීමයි (Parker, 1909:237-239). එළාර රජතුමා විසින් ගොඩනගන ලද විජිතපුර නම් බලකොටුවක් පිළිබඳ වංසකතා සඳහන් කරයි (සිංමව, 1994:25 පරි. 24-47 ගාථා). වර්තමානයේ කලාවැව ආසන්නයේ ඇති විජිතපුරය 'පුරාණ විජිතපුරය' යැයි අදහසක් ඉදිරිපත් වේ (Parker, 1909:237). එහෙත් එළාර රජතුමාගේ විජිතපුරය බලකොටුව පිහිටියේ වර්තමාන පොළොන්නරුව ආශ්‍රිතව බව මෑතකදී සිදු කරන ලද පුරාවිද්‍යා කැණීම් මගින් තහවුරු කරගෙන තිබේ (මාරසිංහ, 2019).

දුටුගැමුණු රජතුමා (ක්‍රි.පූ. 161-137) විජිතපුර බලකොටුව අත්පත් කරගැනීම පිළිබඳ මහාවංසයේ එන තොරතුරුවලට

අනුව විජිත නම් නගරයට (විජිතනගර) යටත් කරගැනීමට පැමිණි රජතුමා ඒ සමීපයේ සමතලා තැනක කඳවුර පිහිට වූ හෙයින් එතැන 'කඳවුරුපිටිය' (ඛන්ධාවාරපිට්ඨි) නමින් ප්‍රකට වී තිබේ (මහාවංසො, 2006:25 පරි. 19-20 ගාථා). මෙම සාධකවලින් ද ඉහත පුරාවිද්‍යා කැණීමෙන් ලද දත්ත තහවුරු කරන බව පෙනේ. යම් හෙයකින් එළාර රජතුමාගේ විජිතපුරය බලකොටුව පිහිටියේ ද, විජිත අමාත්‍යවරයා විසින් පිහිටුවන ලද විජිතගාම/විජිතපුරයේ යැයි පුරාවිද්‍යාත්මකව තහවුරු වන්නේ නම් පොළොන්නරුවේ ඉතිහාසය ආර්ය ජනාවාස පිහිටුවීම දක්වා දිවයන බව පිළිගත හැකිය.

අනුරාධපුර අගනගරයේ සිට කිලෝමීටර අසූවක් පමණ දුරින් පිහිටි පොළොන්නරුව ආශ්‍රිතව මුල් කාලසීමාවේ පටන් ක්‍රමික ජනගහන වර්ධනයක් සිදු වූ බව පැහැදිලි ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පොළොන්නරු ජනතාවගේ ආගමික අවශ්‍යතා සපුරාලීම සඳහා විහාරස්ථාන ද, ජල අවශ්‍යතා සපුරාලීම සඳහා වාරි කර්මාන්ත ද ඉදිකරවීමට අනුරාධපුර පාලකයන් කටයුතු කර තිබේ. දැනට හමුවන තොරතුරුවලට අනුව පළමුවරට පොළොන්නරුව ආශ්‍රිතව විහාරයක් හා වාරි කර්මාන්තයක් කරවන ලද්දේ මහසෙන් රජතුමා (274-301) විසිනි. මහාවංසයේ සඳහන් වන අන්දමට රජතුමා විසින් මින්නේරි විහාරය කරවනු ලැබ තිබේ. මීට අමතරව රජතුමා විසින් කරවන ලද වැව් දහසයක නම් ඇතුළත් ලැයිස්තුවේ පළමුව සඳහන් වන්නේ මින්නේරි මහ වැවයි. ආහාරපාන සුලබ කරවීම පිණිස මෙම වැව් කර වූ බව සඳහන් වන හෙයින් ඒ වන විටත් පොළොන්නරුවේ සෑහෙන තරමින් ජනතාවක් විසූ බව පිළිගත හැකිය (සිං.ම.ව, 1994:37 පරි. 40, 47-50 ගාථා).

ඉන් අනතුරුව පළමුවන උපතිස්ස රජතුමා (365-406) විසින් තෝපා වැව සහ දෙවන අග්‍රබෝධි රජතුමා (571-604) විසින් ගිරිතලේ වැව මෙම ප්‍රදේශයේ ඉදි කරවන ලදී. මහසෙන් රජතුමාගේ විහාර කර්මාන්තයෙන් පසුව තුන්වන අග්‍රබෝධි රජතුමා (628, 629-639) විසින් 'මහාපාණදීප' නම් සංඝාරාමය

මෙහි කරවන ලද බව මහාවංසයේ සඳහන් වේ (සිං.ම.ව, 1994:37 පරි. 186 ගාථාව, 41 පරි. 68-69 ගාථා, 42 පරි. 124 ගාථාව).

මේ ආකාරයට ජනාකීර්ණ නගරයක් බවට පත් වූ පොළොන්නරුව පසුව පාලන මධ්‍යස්ථානයක් වශයෙන් ද යොදා ගැනිණි. ඒ යටතේ හත්වන අග්‍රබෝධි (772-777) හා පස්වන සේන (972-982) යන රජවරුන් පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය වශයෙන් යොදාගත් බව මහාවංසයේ සඳහන් වේ (සිං.ම.ව, 1994:46-48 පරි. 74-75 ගාථා, 54 පරි. 63-67 ගාථා). මින් පැහැදිලි වන්නේ රජකුට විසීමට තරම් සුදුසු ගොඩනැගිලි ආදිය ඒ වන විටත් පොළොන්නරු නගරයේ පැවති බවයි. වරින් වර බලවත් වන රෝහණය පහසුවෙන් පාලනය කිරීමට ද, අනුරාධපුරයට සතුරු තර්ජන එල්ල වන විට ආරක්ෂිතව විසීමට ද පොළොන්නරුව උපකාරී වූ අන්දම මෙමගින් හඳුනාගත හැකිය. චෝළයන් යටතේ පොළොන්නරුව ප්‍රධාන පාලන මධ්‍යස්ථානය බවට පත්වීමට ද ඉහත හේතු බලපෑමක් වන්නට ඇත.

## පොළොන්නරු අගනගරය

වර්ෂ 1017දී ලංකාව ආක්‍රමණය කළ පළමුවන රාජේන්ද්‍ර චෝළ අනුරාධපුරය යටත් කරගත් අතර පස්වන මිහිඳු රජතුමා චෝළයන්ගේ සිරකරුවකු බවට පත් වූ බව මහාවංසයේ සඳහන් වේ (සිංමව, 1994:55 පරි. 01-22 ගාථා; ලං.වි.ලං.ඉ. 1 කාණ්ඩය 1 භාගය, 1964:338). එතැන් පටන් චෝළයන් යටතේ පාලනය වූ ලංකාවේ උතුරු කොටස 'මුම්මුඩි චෝළ මණ්ඩලම්' නමින් හැඳින්විණි. මෙහිදී චෝළයන් තම ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරාගත්තේ පොළොන්නරුවයි. චෝළයන් විසින් පොළොන්නරුව හඳුන්වන ලද්දේ 'ජනනාථපුරම්, ජනනාථ මංගලම්' යන නම්වලිනි (ලං.වි.ලං.ඉ. කාණ්ඩය 11 භාගය, 1972:393-394).

ඉදිරියේදී රෝහණයෙන් එල්ලවිය හැකි අභියෝග පිළිබඳ වඩාත් සැලකිලිමත් වූ චෝළයන් පොළොන්නරුව තම පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරාගන්නට ඇතැයි විශ්වාස කෙරේ.

රෝහණයට අමතරව මලය දේශය පාලනයට ද පොළොන්නරුවේ පිහිටීම උපකාරී විය. ඊසානදිග මෝසමෙන් හා අන්තර් මෝසමෙන් වර්ෂාව ලැබෙන පොළොන්නරුවේ ඒ වන විටත් විශාල වාරි කර්මාන්ත කිහිපයක් පැවතීමේ චෝළයන්ට විශාල පහසුවක් වූ බව පෙනේ (බස්නායක, 2006:240).

**මහා විජයබාහු රජතුමා යටතේ පොළොන්නරුව**

චෝළ පාලනයට එරෙහිව රෝහණයේ පැන නැගුණු අරගල අතරින් සාර්ථකත්වයට පත්වූයේ වර්ෂ 1050 පමණ සිට බලවත් වූ කිත්ති කුමරු ය. අනුරාධපුර රාජවංශයට යම් ඥාති සබඳතාවක් දැක් වූ හෙතෙම තම කටයුතු සඳහා සහාය ලබාගත්තේ බුද්ධරාජ හෙවත් බුදල්නා නම් ජනප්‍රධානියාගෙන්ය. ඒ වන විට රුහුණේ බලවතකු වූ කේශධාතු කාශ්‍යප පරාජයට පත් කිරීමට කටයුතු කළ කිත්ති සහ බුද්ධරාජ රෝහණය එක්සත් කිරීමට සමත්වීම විශේෂ සිදුවීමකි. මෙනිසා වර්ෂ 1055 දී 'මහානාගකුල කිත්ති විජයබාහු' නමින් හෙතෙම රාජත්වයට පත්විය. පසුව උපක්‍රමශීලීව කටයුතු කරමින් රජරට ප්‍රදේශයේ බලය තහවුරු කරගත් විජයබාහු වර්ෂ 1072දී සමස්ත දිවයිනේම පාලකයා වශයෙන් අභිෂේකය ලැබීය (ලං.වි.ලං.ඉ 1 කාණ්ඩය 11 භාගය, 1972:401-406). අනුරාධපුර නගරය නැවත පිළිසකර කිරීමට මහා විජයබාහු රජතුමා කටයුතු කළ නමුත් හෙතෙම තම ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරාගන්නා ලද්දේ පොළොන්නරුවයි. ඒ යටතේ පොළොන්නරු අගනගරයේ ආරක්ෂාව වෙනුවෙන් පවුරු ප්‍රාකාර, දිය අගල් ආදිය ඉදි කර වූ බව මහාවංසයේ සඳහන් වේ (සිංමව, 1994:60 පරි. 01-03 ගාථා).

**සමාලෝචනය**

ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවයන ඉතිහාසයක් සහිත කලාපයක පිහිටා තිබෙන පොළොන්නරුව පූර්ව ඓතිහාසික යුගයේ පටන් ජනාවාසකරණය වූ බවට සාධක හමු වේ. ක්‍රමයෙන් ජනගහන වර්ධනය සමග පොළොන්නරු ජනතාවගේ ආගමික හා ජල අවශ්‍යතා වෙනුවෙන් අනුරාධපුර පාලකයන් විසින් එහි

විහාර හා වාරි කර්මාන්ත කරවනු ලැබ තිබේ. කල්යත්ම ආරක්ෂාව පතා පැමිණි අනුරාධපුර පාලකයන් පවා පොළොන්නරුවේ විසූ බවට තොරතුරු හමු වේ. එවැනි පසුබිමක් තුළ අනුරාධපුර රාජධානියේ බලය අල්ලා ගත් චෝළයන් විසින් තම ප්‍රධාන පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරගනු ලැබුවේ පොළොන්නරුවයි. එහි සිට රෝහණය සහ මලය දේශය පහසුවෙන් පාලනය කිරීමට හැකිවීම ඊට ප්‍රධාන හේතුවයි. චෝළයන් පරාජයට පත් කළ මහා විජයබාහු රජතුමා අනුරාධපුර නගරය ප්‍රතිසංස්කරණය කළ නමුත් තම පාලන මධ්‍යස්ථානය වශයෙන් පොළොන්නරුව තෝරාගන්නේ එහි ඇති ආරක්ෂාව හේතුකොටගෙන ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අදිකාරී, ගාමිණී (2009), 'පුලතිසිපුර කලාපයේ ප්‍රාග් ඉතිහාසය පිළිබඳ විමසුමක්', *පුලතිසි වංශය*, ජයතුංග, නිහාල් පී. (සංස්.), සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය, බත්තරමුල්ල.

කරුණාතිලක, ඇන්.ටී. (1993), *වයඹ ලංකාවේ රාජධානි*, 'කඳවුරු සිරිත', ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ,

*පූජාවලිය* (2009), ඥාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

බස්නායක, එච්.ටී. (2006), *ශ්‍රී ලංකාවේ ශිෂ්ටාචාරය 1*, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

*මහාවංසො* (2006), ඉලංගසිංහ, මංගල (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

මාරසිංහ, ප්‍රියන්ත සුසිල් කුමාර (2019), 'පොළොන්නරු යුගයේ ලංකාවේ පැවති රාජ්‍ය ආරක්ෂක සංවිධානය', https://archaeology.lk

*ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1 කාණ්ඩය 1 භාගය* (1964), විද්‍යාලංකාර පරිවර්තනය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.

*ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය 1 කාණ්ඩය 11 භාගය* (1972), විද්‍යාලංකාර පරිවර්තනය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, කැලණිය.

ලියනගමගේ, අමරදාස (2002), *මධ්‍යකාලීන ලංකා ඉතිහාසය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

*සිංහල මහාවංසය* (1994), සුමංගල හිමි, හික්කඩුවේ සහ දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (පරි.), රත්න ප්‍රකාශකයෝ, කොළඹ.

*Epigraphia Zeylanica Vol. II* (1994), Wickremasinghe, D.M.D.Z. (tr. & ed.), Asian Educational Service, New Delhi.

Parker, H. (1909), *Ancient Ceylon*, Luzac & Co., London.